# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2262/31 - 2022 ජනවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2013 (ii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 44 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 321 වන වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය.

2021, දෙසැම්බර් මස 29 වැනි දින
කොළඹ දී ය.

**නියෝග**

1. (1) මේ නියෝග 2021 අංක 10 දරන වෙළඳ නැව් (නැව්වල ටොන් බර මැනීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 1992 මාර්තු මස 3 වන දින ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරන ලද කලින් කලට සහ පසුව සිදුකරන ලද සංශෝධන පරිදි 1969, නැව්වල ටොන් බර මැනීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (මේ නියෝගවල "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බලාත්මක කිරීම මෙම නියෝගවල කාර්යය විය යුතු ය.

## 1 වන කොටස

### මේ නියෝගවල අදාළත්වය

2. (1) මේ නියෝගයේ (2) වන සහ (3) වන අනු නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ නියෝග, ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති සහ ජාත්‍යන්තර මුහුදු ගමන්වල නිරතවන නෞකාවන්ට සහ ශ්‍රී ලංකා ජල තීරයේ ඇති වෙනත් යම් විදේශීය නෞකාවන්ට අදාළ කරගනු ලැබිය යුතු ය.

(2) මෙම සම්මුතියේ අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇත්තේ නම් මිස, මේ නියෝගඃ

(අ) යුධ නැව්; සහ

(ආ) දිගින් මීටර් 24 ට (අඩි 79 ට) වඩා අඩු නැව්වලට,

අදාළ නොවිය යුතු ය.

(3) සම්මුතියේ ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි මිස, මේ නියෝගවල විධිවිධාන උතුරු ඇමරිකාවේ මහා විල්වල සහ ඇන්ටිකොස්ටි දූපතේ, බටහිර දෙසට කැප් ඩෙස් රොසියර්ස් සිට නිශ්චිත මාර්ගය ඔස්සේ ශාන්ත ලෝරන්ස් ගඟේ නැගෙනහිර දෙසට සහ ඇන්ටි කොස්ටි දූපතේ, උතුරු පැත්තේ, 63 වන මධ්‍යධරණී සහ කැස්පියන් මුහුද; හෝ පුන්ටා රාසා (කබෝ සැන් ඇන්ටෝනියෝ) පුන්ටා ඩෙල් එස්ටේට්, උරුගුවේ අතරින් නිශ්චිත මාර්ගය ඔස්සේ නැගෙනහිර දෙසට ප්ලේට්, පරානා සහ උරුගුවේ ගංගාවල නැගෙනහිර දෙසට පමණක් ගමන් කරන ශ්‍රී ලංකා නැව්වලට අදාළ නොවිය යුතු ය.

3. (1) යම් මුහුදු ගමනකට පිටත්වන අවස්ථාවේ සම්මුතියේ විධිවිධානවලට යටත් නොවන නැවක්, කාලගුණික ආතතිය හෝ වෙනත් අදිසි තත්ත්වයක් හේතුවෙන් අපේක්ෂිත මුහුදු ගමනේ යම් අපගමනයක් සිදුවීම නිසා එකී විධිවිධානවලට යටත් නොවිය යුතු ය.

(2) සම්මුතියේ විධිවිධාන අදාළ කරගැනීමේ දී, කාලගුණික ආතතිය හෝ වෙනත් අදිසි තත්ත්වයක් නිසා ඕනෑම නැවකට සිදුවන යම් අපගමනයක් හෝ ප්‍රමාදයක් පිළිබඳව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිසි සැලකිල්ලක් දැක්විය යුතු ය.

## II වන කොටස

### සහතික කිරීම සහ විමර්ශනය

4. (1) වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා (මෙහි මින්මතු "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් මේ නියෝගවල III වන කොටසට අනුකූලව, දළ සහ ශුද්ධ ටොන් බර තීරණය කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මෙම නියෝගවල III වන කොටසට අනුකූලව දළ සහ ශුද්ධ ටොන් බර නිශ්චය කරනු ලැබ ඇති සෑම නැවකට ම ජාත්‍යන්තර ටොන් බර පිළිබඳ සහතිකය නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන සහ (2) වන අනු නියෝගවල කාර්යයන් සඳහා, පිළිගත් සංවිධාන සඳහා වන ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූලව (මෙම නියෝගවල "පිළිගත් සංවිධාන" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් සංවිධානයක් පිළිගනු ලැබිය හැකි ය.

(ආ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, සහතිකය සඳහා වූ සම්පූර්ණ වගකීම භාරගනු ලැබිය යුතු ය.

(4) එම සහතිකය සම්මුතියේ II වන ඇමුණුමේ දක්වා ඇති ආකෘතියට අනුව සැලසුම් කරනු ලැබිය යුතු අතර එය ඉංග්‍රීසි භාෂාවෙන් විය යුතු ය.

5. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ගිවසුම්ගත රාජ්‍යයක ඉල්ලීම මත නැවක දළ සහ ශුද්ධ ටොන් ප්‍රමාණය නිශ්චය කරනු ලැබිය හැකි අතර සම්මුතියට අනුකූලව එකී නැවට ජාත්‍යන්තර ටොන් බර පිළිබඳ සහතිකයක් නිකුත් කිරීම හෝ නිකුත් කිරීමට බලය දීම සිදුකළ හැකි ය. එසේ නිකුත් කරන ලද යම් සහතිකයක් බලාත්මකවීමට නැවේ ධජය දරන ගිවිසුම්ගත රාජ්‍යයේ ආණ්ඩුවේ ඉල්ලීම මත එය නිකුත් කරනු ලැබ ඇති බවට හෝ යාත්‍රා කිරීමට හිමිකම් ඇති බවට වූ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු අතර 4 වන නියෝගයේ 2 වන අනු නියෝගය යටතේ නිකුත් කරන ලද සහතිකයකට තිබෙන බලාත්මකභාවය ම එයට තිබිය යුතු අතර එම පිළිගැනීම ම ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් එකී සහතිකයේ පිටපතක් සහ (1) වන උප නියෝගයේ සඳහන් කරන ලද ටොන් ගණනයේ පිටපතක් හැකිතාක් ඉක්මනින් ඉල්ලීම කරනු ලබන රජය වෙත සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, සම්මුතියට අදාළව නැවක දළ සහ ශුද්ධ ටොන් ප්‍රමාණය නිශ්චය කර ජාත්‍යන්තර ටොන් බර පිළිබඳ සහතිකයක් නිකුත් කිරීමට හෝ අවසර දෙන ලෙස ගිවිසුම්ගත රාජ්‍යයෙන් ඉල්ලා සිටිය හැකි ය. එසේ නිකුත් කරන ලද යම් සහතිකයක, ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත එය නිකුත් කරනු ලැබ ඇති බව බලපැවැත්වීමට ප්‍රකාශයක් ඇතුළත් කළ යුතු අතර එයට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයකට සමාන බලයක් තිබිය යුතු අතර එම පිළිගැනීම ම ලැබිය යුතු ය.

6\. (1) මෙම නියෝගවල විධිවිධානවල සලසා ඇති යම් ව්‍යතිරේකයන්ට යටත්ව, ජාත්‍යන්තර ටොන් බර පිළිබඳ සහතිකයක, දළ සහ ශුද්ධ ටොන් බරවල වැඩි වීමක් අවශ්‍ය විය හැකි හෙයින්, සකස් කිරීම, ඉදිකිරීම, ධාරිතාව ඉඩකඩ භාවිතය, නැවේ මගී සහතිකයේ දක්වා ඇති පරිදි නැවේ ගෙන යාමට අවසර දී ඇති සම්පූර්ණ මගී සංඛ්‍යාව, පනවන ලද පැටවුම් රේඛාව හෝ නැවට අනුමත කරන ලද ගැඹුර වෙනස් කර ඇත්නම් ජාත්‍යන්තර ටොන් බර පිළිබඳ සහතිකය බල රහිත වන අතර එය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නැවකට නිකුත් කරන ලද සහතිකයක් වෙනත් රාජ්‍යක ධජය දරන නැවකට මාරු කිරීමෙන් පසු මෙම නියෝගවල (3) වන උප නියෝගයේ නිශ්චිතව විධිවිධාන සලසා ඇති පරිදි හැර එකී සහතිකය බල රහිත කරනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාව ලියාපදිංචි වී ගිවිසුම්ගත රාජ්‍යයක වෙනත් ධජයක් යටතට නැව මාරු කිරීමෙන් පසු, ජාත්‍යන්තර ටොන් බර පිළිබඳ සහතිකය මාස තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා හෝ ඒ වෙනුවට වෙනත් ජාත්‍යන්තර ටොන් බර පිළිබඳ සහතිකයක් ගිවිසුම්ගත රාජ්‍යයෙන් නිකුත් කරන තෙක් යන සිදුවීම්වලින් පළමුව සිදුවන අවස්ථාව තෙක් බලාත්මක විය යුතු ය. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සහතිකයේ සහ අදාළ ටොන් ගණනය කිරීම්වල පිටපතක් නැව මාරු කරනු ලැබ ඇති ගිවිසුම්ගත රාජ්‍ය වෙත සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

7\. ගිවිසුම්ගත රාජ්‍යයක අධිකාරිය යටතේ නිකුත් කරන ලද සහතිකය, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සම්මුතිය මගින් ආවරණය කරන ලද සියලු කාර්යයන් සඳහා පිළිගනු ලැබිය යුතු ය. ඒ සහතික ඔවුන් විසින් නිකුත් කරන ලද සහතික හා සමාන බලයක් ඇති ලෙස අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සලකනු ලැබිය යුතු ය.

8\. (1) විදේශීය නැවක් ශ්‍රී ලංකාව තුළ යම් වරායක හෝ ස්ථානයක නවතා ඇති විට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිසි ලෙස බලය පවරන ලද නිලධරයන් විසින් පරීක්ෂා කරනු ලැබිය හැක.

(2) (1) වන අනු නියෝගයේ සඳහන් කරන ලද පරීක්ෂා කිරීම්ඃ

(අ) නැව වලංගු ජාත්‍යන්තර ටොන් බර පිළිබඳ සහතිකයක් දරන බවට; සහ

(ආ) නැවේ ප්‍රධාන ලක්ෂණ සහතිකයේ දක්වා ඇති දත්තවලට අනුරූපවන බවට,

සත්‍යාපනය කිරීමේ කාර්යයට සීමා කරනු ලැබිය යුතු ය.

(3) (1) වන අනු නියෝගවල සඳහන් කරන ලද පරීක්ෂාව නැවේ කිසිදු ප්‍රමාදයකට බල නොපෑ යුතු ය.

(4) නැවේ ප්‍රධාන ලක්ෂණ, ජාත්‍යන්තර ටොන් බර පිළිබඳ සහතිකයේ ඇතුළත් කරුණුවලින් දළ ටොන්වලින් හෝ ශුද්ධ ටොන්වලින් වැඩිවීමට මුල්වන පරිදි වෙනස්වන බවට පරීක්ෂාවෙන් හෙළිදරව් වන විට නැව අයත් ධජය දරන රාජ්‍යයේ ආණ්ඩුවට නොපමාව දැනුම් දෙනු ලැබිය යුතු ය.

9\. මේ නියෝගවල 4 වන නියෝගයේ සඳහන් කරන ලද වලංගු සහතිකයක් එය දරනු ලබන්නේ නම් හැර සම්මුතියේ වරප්‍රසාද, යම් නැවක් සම්බන්ධයෙන් ඉල්ලා සිටිය නොහැකි ය.

10\. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්,

(අ) ගිවිසුම්ගත රාජ්‍යයන්වල බෙදාහැරීම සඳහා සම්මුතියේ විධිවිධාන අනුව නිකුත් කරන ලද ඔවුන්ගේ සහතිකවල ප්‍රමාණවත් ආකෘති සංඛ්‍යාවක්;

(ආ) සම්මුතියේ විෂය පථය තුළ විවිධ කරුණු පිළිබඳව ශ්‍රී ලංකාව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නීති පාඨ, නියමයන්, නඩු තීන්දු, නියෝග සහ වෙනත් සාධන පත්‍ර; සහ

(ඇ) ටොන් බර සම්බන්ධ කාරනාවල දී අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙනුවට කටයුතු කිරීමට බලය දෙන ලද පිළිගත් ආයතනවල ලැයිස්තුවක්,

සංවිධානය වෙත සන්නිවේදනය කිරීමට සහ තැන්පත් කිරීමට භාරගනු ලැබිය යුතු ය.

## III වන කොටස

## නැවක දළ සහ ශුද්ධ ටොන් බර නිශ්චය කිරීම

11. (1) නැවක ටොන්වල දළ ටොන් සහ ශුද්ධ ටොන් ඇතුළත් විය යුතු ය.

(2) නැවක ශුද්ධ ටොන් (GT) ප්‍රමාණය සම්මුතියේ 3 වන නියෝගයේ විධිවිධානවලට අනුකූල වෙමින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) නැවක දළ ටොන් (NT) ප්‍රමාණය සම්මුතියේ 4 වන නියෝගයේ විධිවිධානවලට අනුකූල වෙමින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) නිර්ණය කිරීම් සඳහා මේ නියෝගවල විධිවිධාන අදාළ කර ගැනීමේ දී නව ආකාරයේ ඉදිකිරීම් ලක්ෂණ ඇති යාත්‍රාවල ශුද්ධ ටොන් සහ දළ ටොන්වල ප්‍රමාණය අසාධාරණ හෝ ප්‍රායෝගික නොවන විට එය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය. එසේ ටොන් ප්‍රමාණය නිශ්චය කරන අවස්ථාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ කාර්යය සඳහා භාවිතා කළ ක්‍රමවේදයේ තොරතුරු සංවිධානයට දැනුම් දෙනු ලැබිය යුතු ය.

12. (1) සහතිකයක් නිකුත් කිරීමේ දී අවශ්‍ය කරන දළ ටොන් ප්‍රමාණයේ වෙනස්වීම - සම්මුතියේ 3 වන සහ 4 වන නියෝගවල නිර්වචනය කර ඇති V, VC, d, N1 හෝ N2 යන අගයන් වෙනස්වන විට හා ඒවා වෙනස් කළ විට ඒ වෙනස් කිරීම හේතුවෙන් සම්මුතියේ 4 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරන ලද පරිදි දළ ටොන් ප්‍රමාණය වැඩි වන අවස්ථාවක දී නව ලක්ෂණවලට අනුරූපව නැවේ නව දළ ටොන් ප්‍රමාණය නිශ්චය කරනු ලැබිය යුතු අතර ප්‍රමාදයකින් තොරව අදාළ කර ගනු ලැබිය යුතු ය.

(2) සම්මුතියේ 4 වන නියෝගයේ (2) (අ) සහ (2) (ආ) අනු ඡේදවල සඳහන් කරන ලද පැටවුම් රේඛාවන් සමගාමීව නියම කර ඇති නැවකට සම්මුතියේ 4 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කර ඇති පරිදි එක් දළ ටොන් බරක් පමණක් ලබා දිය යුතු අතර එම දළ ටොන් බර, නැව සම්බන්ධවන වෙළඳ කටයුතු සඳහා නිසිලෙස නියම කරන ලද පැටවුම් රේඛාවට අදාළ ටොන් බර විය යුතු ය.

(3) සම්මුතියේ 3 වන සහ 4 වන නියෝගවල නිශ්චිතව දක්වා ඇති පරිදි V, VC, d, N1 හෝ N2 ලෙස නැවක නෛසර්ගික ලක්ෂණ වෙනස් කර ඇති විට හෝ මේ නියෝගයේ (2) වන උප නියෝගයේ සඳහන් කරන ලද නිසි ලෙස පවරන ලද පැටවුම් රේඛාව, ඒ නැව සම්බන්ධ වී සිටින වෙළඳාම වෙනස් වීම හේතුවන අවස්ථාවක දී සහ සම්මුතියේ 4 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව එහි ටොන් බර අඩුවන අවස්ථාවක දී එසේ නිශ්චය කරන ලද දළ ටොන් ප්‍රමාණය ඇතුළත් කර අලුත් ජාත්‍යන්තර ටොන් සහතිකයක් (1969), වත්මන් සහතිකය නිකුත් කරනු ලැබූ දින සිට මාස දොළහක් ගෙවී යන තෙක් නිකුත් කිරීම නොකළ යුතු ය; එසේ වුව ද,

මෙම නියමයන්:

(අ) නැව වෙනත් රාජ්‍යයක ධජයක් යටතට මාරු කර ඇත්නම්; හෝ

(ආ) නියම කරන ලද පැටවුම් රේඛාව වෙනස් කිරීමක් අවශ්‍ය වන උපරිව්‍යුහයක් ඉවත් කිරීම වැනි, ප්‍රධාන ලක්ෂණයක් විය හැකි යයි අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සලකනු ලබන වෙනස් වීම් හෝ වෙනස් කිරීම්වලට නැව යටත් වේ නම්; හෝ

(ඇ) විශේෂ වෙළඳාම්වල දී නිදහ මැදිරි වෙන් කර නොගත් මගීන් විශාල වශයෙන් රැගෙන යාම පිණිස යොදවා ඇති මගී නැව්වලට

අදාළ නොවිය යුතු ය.

13. (1) ශුද්ධ සහ දළ ටොන් ප්‍රමාණය ගණනය කිරීමේ දී ඇතුළත් කරන ලද සියලු පරිමාවන්වල ගණනය, කවචයේ ඇතුල් පැත්තේ හෝ නැව තුළ ලෝහවලින් සාදන ලද තහඩු අල්ලන ලද සීමා ව්‍යූහ සහ කවචයේ පිට පෘෂ්ඨයේ හෝ නැව තුළ ඇතුල් පැත්තේ වෙනත් ලෝහවලින් සාදන ලද සීමා ව්‍යූහ පෘෂ්ඨයන් වැනි පිටතින් ඇල්ලූ ඇවුරුම් හෝ එවැනි දේ නොසලකා තක්සේරු කරනු ලැබිය යුතු ය.

(2) උපාංගවල පරිමාව මුළු පරිමාව තුළ ඇතුළත් කළ යුතු ය;

(3) මුහුදට විවෘත වන අවකාශයේ පරිමාව මුළු පරිමාවෙන් බැහැර කරනු ලැබිය යුතු ය;

14. (1) පරිමාව ගණනය කිරීමේ දී භාවිතා කළ සියලුම මිනුම් ආසන්නම සෙන්ටිමීටරයට හෝ අඩියකින් විස්සෙන් එකකට ගණනය කළ යුතු ය.

(2) පරිමාව, අවකාශය සඳහා සාමාන්‍යයෙන් පිළිගත් සහ අධ්‍යක්ෂ-ජනරාල්වරයා හට නිරවද්‍යතාවයකින් පිළිගත හැකි ක්‍රමවේදයක් මගින් ගණනය කළ යුතු ය.

(3) ගණනය කිරීම, පරීක්ෂා කිරීමට අවසර දීම සඳහා ප්‍රමාණවත් පරිදි සවිස්තරාත්මක විය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය

15. සම්මුතියට අදාළව 1978 ප්‍රොටකෝලය මගින් වෙනස් කළ පරිදි, 1973 නැව්වලින් සිදුවන දූෂණ වැලැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ 1 වන ඇමුණුමේ 18 වන නියෝගයට අනුකූල වෙමින් වෙන් කරන ලද පිරවුම් ද්‍රව්‍ය අඩංගු ටැංකි තෙල් නෞකාවල සපයා ඇති අවස්ථාවක දී මෙම ටැංකිවල මුළු ටොන්බර දක්වමින් (1969) ජාත්‍යන්තර ටොන් සහතිකයට අනුව සඳහනක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ වෙන් කරන ලද පිරවුම් ද්‍රව්‍යවල ටොන් බර පහත දැක්වෙන සූත්‍රයට අනුව ගණනය කරනු ලැබිය යුතු ය.

$$K_1 \times Vb$$

අවස්ථාවः

$$K_1 = 0.2 + 0.02 \log_{10} V$$

V = ජාත්‍යන්තර සම්මුතියේ 3 වන නියෝගයේ නිර්වචනය කර ඇති පරිදි නැවේ වැසුණු සියලු අවකාශවල මුලු පරිමාව ඝන මීටර්වලින්; සහ

Vb = ජාත්‍යන්තර සම්මුතියේ 6 වන නියෝගයේ වෙන් කරන ලද පිරවුම් ටැංකිවල මුලු පරිමාව ඝන මීටර්වලින්.

16. ශ්‍රී ලංකාව තුළ යම් වරායක හෝ ස්ථානයක පවතින යම් නැවක්, නැව් බඳේ, උපකරණයක හෝ කළමනාකරණය යටතේ පවතින යාන්ත්‍රණයක, අධි බර පැටවීමක හෝ නුසුදුසු පැටවීමක දෝෂ තත්ත්වයක් හේතුවෙන්; සම්මුතියට අනුකූල නොවන අවස්ථාවක් වන විට දී ඒ නැව අරමුණු කරන්නේ කුමන සේවාවක් ද ඒ සේවාවට සම්බන්ධ වෙමින් මිනිස් ජීවිතයට බරපතල හානියක් නොමැතිව මුහුදට දියත් කිරීමට නුසුදුසු අනාරක්ෂිත නැවක් බවට සොයා ගනු ලබන අවස්ථාවක දී දෝෂ සහිත තත්ත්වය සෝදිසි කිරීම හෝ නිවැරදි කිරීමේ කාර්යයන් සඳහා යම් නැවක්, තාවකාලිකව රඳවා ගනු ලැබිය හැකි ය.

17. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මෙම නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි පරිදි සම්මුතියේ විධිවිධානවල අවම තාක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලවීම සඳහා යම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

18. මේ නියෝගවල :-

"ශුද්ධ ටොන්" යන්නෙන්, පවත්නා සම්මුතියේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරන ලද නැවක සම්පූර්ණ ප්‍රමාණය මැනීම අදහස් වේ;

"දළ ටොන්" යන්නෙන්, පවත්නා සම්මුතියේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරන ලද නැවක ප්‍රයෝජනයට ගන්නා ධාරිතාව මැනීම අදහස් වේ;

"සංවිධානය" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ.

EOG 01 - 0250

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.